www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඔබාමාගේ පදවි ප්‍රාප්ති කථාව: නිස්සාරත්වය හමුවේ කප්පාදු පිලිවෙත් සඳහා කල කැඳවුමක්

**Obama's inaugural address: Amid banalities, a call for austerity**

**2009 ජනවාරි 21**

ජනවාරි 20 වන දින පැවති ජනාධිපති ඔබාමාගේ පදවි ප්‍රාප්ති කථාවෙන් ආර්ථික අර්බුදයට මුහුනදීම හෝ යුද්ධය අවසානයකට ගෙන ඒම කෙරෙහි යොමුවූ සංයුක්ත ප්‍රතිඥාවන් හෝ ක්‍රියාමාර්ගයන් කිසිවක් ඉදිරිපත් වූයේ නැත. ඒ වෙනුවට ඔහු අඟවා සිටියේ ඇමරිකානු ජනතාව තව තවත් දැඩි කැපකිරීම් කල යුතු බවයි.

ජනාධිපති තනතුරට ප්‍රථම වතාවට අප්‍රිකානු-ඇමරිකානුවෙකු පත්වීම මඟින් තවත් ඔප් නංවනු ලැබූ, ඇමරිකානු සමූහාන්ඩුවේ උපත දක්වාම වසර 220 ක් ඈතට දිව යන පුහු ගාම්භීරත්වය හා සැනකෙලි ස්වභාවයට ඔබාමාගේ නීරස වචන හා ඔහුගේ පනිවිඩයෙහි හිස් බව තියුනු ලෙස විසංවාදී විය.

වොෂින්ටන් පරිශ්‍රයට එදින රැස්වූ මිලියන ගනනකගේ උද්දාමය සලකුනු කලේ, අප්‍රිකානු-ඇමරිකානුවෙක් බලයට පත්වීමෙන් අව්‍යාජ වෙනසක් සිදුවනු ඇතැයි ද, කැපිටොල් හිල්හි පිය ගැට පෙල මත ප්‍රථම වතාවට පෙනී සිටිය අවස්ථාවේ රැස්ව සිටි ජනතාවගේ හූ හඬට මුහුන දුන් ජෝර්ජ් ඩබ්. බුෂ් ගෙන් අත්මිදීමේ බලාපොරොත්තුවෙන් ද ය. උත්සවය අවසානයේදී ඔබාමාද කැටුව පරිශ්‍රයට ඉහලින් හෙලිකොප්ටරයකින් ගමන්ගත් එරට ඉතිහාසයේ වඩාත්ම වෛරයට පාත්‍රවූ ජනාධිපති බුෂ් වෙත රැස්ව සිටියවුන්ගෙන් පල වූයේ ක්‍රීඩා තරඟයකදී ප්‍රති විරුද්ධ කන්ඩායමට උසුලු විසුලු කිරීම සඳහා ප්‍රේක්ෂකයන් නිතර භාවිතා කරන වර්ගයේ සමු දීමකි. ''නා-නා-නා-නා, නා-නා-නා-නා, හේයි, හේයි, ගුඩ්බායි.''

නව ජනාධිපතිගේ පදවි ප්‍රාප්තිය, සොරා ගත් මැතිවරනයෙන් ආරම්භවූ ආක්‍රමනකාරී යුද්ධ දෙකක් ද, ව්‍යවස්ථාපිත අයිතීන් මත පල්ල කල පෙර නොවූ විරූ ප්‍රහාරයන් ද, බාධාවකින් තොරව වැඩී ගිය සමාජ අසමානතාවය හා නූතන ඇමරිකානු ඉතිහාසය තුල ගැඹුරුම ආර්ථික අර්බුදය ද කඩා පාත් කල දුර්දාන්ත ජාතික පාලනයක අට වසරේ නිමාව සලකුනු කරනු ඇතැයි යන පොදු බලාපොරොත්තුවෙන් පිරී පැවතුනි.

එහෙත් ඔබාමාගේ කථාව බොහෝකොටම එවන් බලාපොරොත්තු බොඳකර දැමීම අරමුනු කරගෙන කෙටුම්පත් කල එකක් බව පෙනී යයි. ව්‍යාපාරික මාධ්‍ය ද *නිව්යෝර්ක් ටයිම්ස්* හා *වොෂින්ටන් පෝස්ට්* යන වෙබ් අඩවි දෙකෙහිම ප්‍රධාන ලිපි සිරස්තල ද ජාත්‍යන්තරව ද හඬ නැගූ පනිවිඩය වූයේ ඔබාමා කැඳවුම් කලේ ''ජාත්‍යන්තර වගකීමේ නව යුගයකට'' ය යන්නයි.

වගකීමේ මූලධර්මය ඉතා සියුම් ලෙස යොදා ගැනීමේදී මෙම ආයාචනය තුල වක්‍රෝක්තියේ කුඩා පංගුවකට වඩා වැඩි දෙයක් අන්තර්ගතව තිබේ. මෑත සතිවල ඔබාමා ද ඔහුගේ අනුශාසකයන් ද, බුෂ් චේනි හෝ අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඔවුන්ගේ පාලන කාලය තුල කරනු ලැබූ යුධ අපරාධ හා ව්‍යවස්ථා විරෝධී කටයුතු පිලිබඳ චෝදනාවලට ලක් කිරීමට තමන්ගේ කිසිදු බලාපොරොත්තුවක් නොමැති බව පුන පුනා ප්‍රකාශ කොට තිබුනි.

ධනේශ්වර ඇමරිකානු ඉතිහාසයේ ගැඹුරුතම මූල්‍ය අර්බුදය හමුවේ, අඩුම තරමින් ඔබාමාගේ තක්සේරුවට අනුව, මුදුනේ සිටින කිසිවෙකුත් විශේෂ වගකීමක් දරන්නේ නැත. ඔහු කථාව ආරම්භයේදී මෙසේ ප්‍රකාශ කලේය. ''සමහරෙකුගේ කෑදරකමත් වගකීම් විරහිත කමත් එසේම, ජාතිය නව යුගයක් සඳහා සූදානම් කිරීමේදී දැඩි තීන්දු ගැනීමට පොදුවේ අප අසමත් වීමත් හේතුකොටගෙන අපගේ ආර්ථිකය බෙහෙවින් දුබල වී තිබේ.''

මෙම සූත්‍රගතකිරීම මඟින්, තමන්ගේම ආයතනත් ලෝක ආර්ථිකයත් විනාශය කරා ඇදගෙන යාමට දායකවූ වෝල් වීදියේ විධායකයන්ගේ හා ආරක්ෂිත අරමුදල් කලමනාකරුවන්ගේ මූල්‍ය පරපුටුභාවය හා සාපරාධිත්වය හමුවේ පැනනැඟනාවූ වත්මන් අර්බුදයට කිසිදු සම්බන්ධයකින් තොරව තමන්ගේ රැකියා හා නිවාස අහිමිවීමට මුහුනපා සිටින දශලක්ෂ සංඛ්‍යාත වැඩකරන ජනතාව එක සමානව වගකීමට බැඳ දමයි.

දැන් ඔබාමා වැඩකරන ජනතාවට කියා සිටින්නේ, ඩොලර් ට්‍රිලියන ගනන් පොදු අරමුදල් වලින් වෝල් වීදිය බේරාගැනීමට ඇපදෙන අතර එහි ප්‍රමුඛ විධායකයන් ඉලක්කම් හතේ හා අටේ වන්දි මුදල් ඇදගනිද්දී, තම රැකියා, වැටුප් හා සමාජ සහනාධාර මත එල්ල කෙරෙන තව තවත් ප්‍රහාර පිලිගනිමින් තම

ජීවනෝපායන් විනාශ කරන අර්බුදය සඳහා වගකීම භාරගැනීමට සූදානම්වන ලෙයසි.

ඔබාමාගේ සමහර පුරසාරම් තුල ඔහු හා ඔහුගේ කථා රචකයන්, මහා අවපාතයේ ආගාධය තුල 1933 දී ෆ්‍රැන්ක්ලින් ඩී රූස්වෙල්ට් විසින් පැවැත්වූ ඔහුගේ පදවි ප්‍රාප්ති කථාවට වලකැපීමේ උත්සාහයක නිරතව සිටි බවට ඇඟවුම් තිබේ. ජනවාරි 20 වන දින ඔබාමාගේ දිව්රුම් දීම සිදුවෙමින් තිබියදී කොටස් වෙලඳපොලේ පුලුල්ම දර්ශකයේ අගය සියයට 5 කින් අහොසි කරමින් ඒකක 8000 සීමාවෙන් පහලට කඩාවැටීම මගින් සලකුනු කල ආකාරයට පැහැදිලිවම එහි ඓතිහාසික සමාන්තරයක් පවතියි.

එහෙත් වඩාත්ම කැපී පෙනුනේ 76 වසරකට පෙර රූස්වෙල්ට් කල ආකාරයේ අවංක භාවයකින් කථා කිරීමට ඔබාමා දැක්වූ අසමත් කමයි. සියල්ලටමත් වඩා නව ජනාධිපතිගේ පදවි ප්‍රාප්ති කථාව තුල අංගලක්ෂිත වූයේ කිසි දෙයක් ගැන සංයුක්ත යමක් නොතිබීමේ තැතිගන්නා සුලු ස්වභාවයයි.

රූස්වෙල්ට් ජාතිය අමතන අවස්ථාවේදී ඔහු දිව්රා කීවේ ''අවංකව හා කෙලින්ම සත්‍යය, සත්‍යයම පමනක් පවසන'' බවයි. එහෙත් ඔහුගේ අරමුන සමාජ විප්ලවයෙන් ධනවාදය ආරක්ෂාකර ගැනීම වූ තාක් දුරට ඔහු එසේ නොකල අතර, තරමක් පැහැදිලි වචන වලින් අර්බුදය නිර්මානය කලේ කවරක් විසින් ද හා ඒ පිලිබඳව ඔහු කුමක් කිරීමට අදහස් කරන්නේ ද යන්න කියා සිටියේ ය. රූස්වෙල්ට් මෙසේ පැවසීය. 1930 ගනන් වල අර්බුදය හටගත්තේ ජාතියේ ''පරිත්‍යාගයන්'' හිගකමෙන් හෝ එය උත්සන්න කිරීමේ ''මානුෂික ව්‍යායාමයක්'' නිසා නොව, ''මානව වර්ගයාගේ නිමැවුම් හුවමාරු කිරීමේදී පාලකයන් දැක්වූ මුරන්ඩුකම හා ඔවුන්ගේ අදක්ෂභාවය හේතුකොට ගෙනය.'' ඔහු මෙසේ ද පැවසීය. ''මුදල් හුවමාරුකරුවන්ගේ ප්‍රතිපත්ති විරහිත ක්‍රියාකාරකම් මහජන විනිශ්චය හමුවේ චෝදනාවට ලක්වූ අතර මිනිසුන් සිතින් හා හදවතින්ම ඒවා ප්‍රතික්ෂේප තලහ.

ඔබාමා ඔහුගේ කථාවෙන් කොටසක් මෙම සංකල්පයේ මුල් භාගයෙන් උපුටා ගත් බව පෙනෙන්නට තිබෙන අතර මෙසේ ප්‍රකාශ කලේය. ''අපගේ කම්කරුවන් මෙම අර්බුදයේ ආරම්භයේදී සිටියාට වඩා අඩු පලදායිත්වයකින් යුතුව සිටිනවා නොවේ. නිර්මානාත්මක බවින් අපගේ සිතුවිලි පහත වැටී හෝ අපගේ භාන්ඩ හා සේවා පසුගිය සතියේ, පසුගිය මාසයේ හෝ පසුගිය වසරේ තිබූනාට වඩා අවශ්‍යතාවෙන් අඩුවී ඇතුවා ද නොවේ.'' කෙසේවුව ද නොපවසා මග හැර ඇත්තේ, තත්වය මෙසේනම් එක්සත් ජනපදය තුල පසුගිය වසරේ පමනක් මිලියන තුනකට ආසන්න රැකියා ප්‍රමානයක් අහෝසි කරමින් ආර්ථිකය අවපාතයක් කරා පහතට වැටෙමින් ඇත්තේ මන්ද යන්නය.

මෙම මගහැරීමට හේතුව වන්නේ ඔහුට සහයෝගය දැක්වූවන් කෙරෙහි පලවන සතුරුභාවයේ හා නොතැකීමේ තැතිගන්නා සුලු මට්ටමයි. නිසැකවම ඔහුට හැඟෙනු ඇත්තේ ඔවුන් වෙත එවන් පැහැදිලි කිරීමක් අනවශ්‍යය යන්න හා අඩුවෙන් කථාකිරීම වඩාත් යෝග්‍යය යන්නයි.

වර්තමාන ''මුදල් හුවමාරුකරුවන්'' ගේ ක්‍රියාකලාපය ගැන වචනයක් වත් සඳහන් කිරීමට ඔබාමාට නොහැකි විය. ඔහුගේ මැතිවරන ව්‍යාපාරයේ අරමුදලින් වැඩිම පංගුව ගෙවනු ලැබුවේත් දිව්රුම්දීමේ උත්සවයේ වියදම පවා දැරුවේත් ඔවුන් ය. ''සමානතාවය'' පිලිබඳ සියලු කෙඳිරිලි හා දෙඩවීම් තිබියදී ම ඇමරිකාවේ පුලුල් වැඩකරන ජනතාවගේ වියදම මතින් ඔහු ආරක්ෂා කිරීමට කැපවී ඇත්තේ එම මූල්‍ය ප්‍රභූවේ අවශ්‍යතාවන්ම ය.

ආන්ඩුව හා ධනේශ්වර වෙලඳපොලේ ක්‍රියාකලාපය පිලිබඳ සීමා ඉක්මවා ගිය ''පැරනි පිලුනු වූ දේශපාලන විවාදයන්'' ගැන ඔහු කල ප්‍රකාශයන්ගේ හා ''අප්‍රසන්න තීන්දු ගැනීමට පැකිලුනු කාලය අවසන් කල යුතුව ඇතැයි'' යන ඔහුගේ දිව්රීමේ සැබෑ වැදගත්කම මෙයයි.

''අප අද අසන ප්‍රශ්නය නම් අපගේ ආන්ඩුව ලොකු ද කුඩා ද යන්න නොව එය ක්‍රියාකාරී ද යන්නයි. එහිදී පිලිතුර ඔව් අප පෙරට යාමට අපේක්ෂා කරන්නේය යන්නයි. නැත යන පිලිතුර සහිත ක්‍රියාමාර්ග අවසන් විය යුතුයයි.'' ඔහු කියා සිටියේය. යලිදු වතාවක් කුමන ක්‍රියාමාර්ග අහෝසි කල යුතු ද යන නිශ්චිතභාවය එහි නැත. එහෙත් පසුගිය සතියේ ඔහු ඇඟවුම් කර ඇත්තේ ආන්ඩුවේ මූල්‍ය අර්බුදය ජය ගැනීමේ මාධ්‍යයන් ලෙස සමාජ ආරක්ෂනය හා සෞඛ්‍ය පහසුකම් ද ඇතුලු අත්‍යවශ්‍ය සමාජ වැඩපිලිවෙලවල් තියුනු ලෙස කපා හැරීමට තමා අදිටන් කර ගෙන සිටින බවයි.

''අප ඉදිරියේ ඇති ප්‍රශ්නය වෙලඳපොල වනාහි හොඳ හෝ නරක බලවේගයක් ද යන්න ද නොවේ. ධන උත්පාදනයටත් නිදහස පුලුල් කිරීමටත් එය සතු ශක්තිය පෙර නොවූ විරූය'' ඔහු කියා සිටියේය. වත්මන් අර්බුදය පෙන්නුම් කරන්නේ ''සුපරීක්ෂාකාරී ඇසක'' අවශ්‍යතාවය බව කියා සිටි ඔහු ''සෞභාග්‍ය කරා ලඟාවීමට අභිලාෂවත් සියල්ලන්ට අවස්ථාව'' ලබාදීම පිලිබඳව විශ්වාසය පල කලේය. පසුගිය දශක තුන පුරාවට වෝල් වීදිය හා ව්‍යාපාරික ප්‍රජාව වෙනුවෙන් ඇමරිකාව පාලනය කල රොනල්ඩ් රේගන් හෝ අනෙකුත් දක්ෂිනාංශික දේශපාලඥයන්ගේ කථාවලින් උපුටා ගත නොහැකි කිසිවක් මෙහි ඇත්තේ නැත.

අර්බුදය ජයගැනීමට අවශ්‍යයෙන්ම ගත යුතු යයි ඔහු සලකන වර්ගයේ පියවරයන් ගෙනහැර දක්වමින් ඔබාමා ''තම මිතුරෙකුගේ රැකියාව අහිමි වනවා දැකීමට වඩා තමාගේ වැඩකරන පැය ගනන කැපීම පිලිගැනීමට තරම් පරාර්ථකාමී කම්කරුවන්'' ගැන සඳහන් කිරීම

අහම්භයක් නොවේ. මෙම වචන පිටවන්නේ ආන්ඩුවේ ඇප පිට බේරී ගත් බැංකුකරුවන් මොනම කැපකිරීමකට හෝ විරුද්ධ වන තතු තුල රට පුරා කම්කරුවන් රැකියා සුරකීමේ නාමය යටතේ වැටුප් හා වැඩ පැය ගනන කැපීමෙන් පීඩාවට පත්ව සිටින තත්වයකදී ය.

### ''ත්‍රස්තයට එරෙහි යුද්ධය'' ගෙනයා යුතුය

විදේශ ප්‍රතිපත්තිය සදාචාරයේ හා පරාර්ථකාමයේ සලුපිලි වලින් එතීමට තරමක වැඩි අවධානයක් යොදන අතරම ඇමරිකාවේ යුදකාමය හා මිලිටරිවාදය එලෙසම ගෙනයනු ඇතැයි යන්න කථාව පුරාම දිවගිය දෙවන ප්‍රධාන තේමාවයි.

කථාවේ පලමු වැදගත් පේලිය තුල ඔබාමා මෙසේ පැවසීය. ''අපගේ ජාතිය ප්‍රචන්ඩත්වයේ හා වෛරයේ දුර දිග යන ජාලයකට එරෙහි යුද්ධයක නියැලී සිටියි.''ඇඟවුම නොවරදින සුලුය. බුෂ් පාලනාධිකාරය ආක්‍රමනකාරී යුද්ධ දෙකක් දියත් කිරීම සඳහාත් වධ බන්ධන, අසාමාන්‍ය අනුවර්තනය, නීති විරෝධී රඳවා තැබීම හා රටවැසියන්ගේ ඔත්තු බැලීම සඳහාත් නිමිත්ත ලෙෂ යොදාගත් ''ත්‍රස්තයට එරෙහි ගෝලීය යුද්ධය'' විරාමයකින් තොරව ගෙනයනු ඇත.

සිය පරිපාලනය යටතේ මෙසේ සිදුවන බවට ඔබාමා දිව්රීය. ''අපි ඉරාකය එහි ජනතාවට පවරා වගකිවයුතු පරිදි ඉවත් වන්නෙමු. ඇෆ්ගනිස්ථානය තුල ඉතා දුෂ්කරවූ සාමය ඇතිකරන්නෙමු.'' කෙසේ වෙතත් මෙම යුද්ධ දියත් කිරීමට තීන්දු කිරීම පිලිබඳව වචනයකින් හෝ විවේචනයක් ඇත්තේ නැත. යථාර්තය නම් නව පරිපාලනය, ඉරාකය ''එහි ජනතාවට පවරා'' ඉවත්වීම කෙසේ වෙතත් වඩා පුලුල් පරිමානයකින් ආර්ථික ග්‍රහනය දින නියමයකින් තොරව පවත්වාගෙන යන බවටත් ඇෆ්ගනිස්ථානයේ යුද්ධය ව්‍යාප්ත කිරීම සඳහා එක්සත් ජනපදය අතිරේක හමුදා දස දහස් ගනනින් එරටට පිටත්කර හරින බවටත් දැනටම ඇඟවුම්කර තිබීමයි.

''අපගේ ජීවන රටාව ගැන අප සමාව අයැදින්නේ නැතුවාක් මෙන්ම එය ආරක්ෂාකිරීමේදී අප සැලෙන්නේ ද නැත.'' යනුවෙන් ඔබාමා ප්‍රකාශකරන විටත්, ''තමන්ගේ රටවල්තුල ඇති ප්‍රශ්න පිලිබඳව බටහිරට දොස් පවරන්නේයයි'' විදේශ නායකයන් - මෙයින් ඔහු අදහස් කරනවා ඇත්තේ අප්‍රිකාවේ, ආසියාවේ, මැද පෙරදිග හා ලතින් ඇමරිකාවේ ඓතිහාසිකව පීඩිත රටවල - හෙලාදකින විටත් කථාව තුලින් උද්ධච්ඡකමේ හා යුදකාමයේ කැත හඬක් නැංවෙයි.

''ත්‍රස්තය හා අහිංසකයන් සමූලඝාතනය කිරීම තුලින් සිය අරමුනු මුදුන්පමුනුවා ගැනීමට උත්සාහ කරන අය'' ට ඔහු පුරසාරම් සහගතව අභියෝග කරන අතර ''අපි ඔබව පරාජය කරන්නෙමු'' යයි දිව්රා සිටියි. නිහඬව සිටීම මගින් ඔබාමාගෙන් ලද සහයෝගය ද හමුවේ එක්සත් ජනපදයෙන් සැපයුනු අවි භාවිතා කරමින් දහස් ගනනක් අහිංසක පලස්තීනුවන් මරාදමා හෝ අංගවිකලයන් බවට පත්කල ගාසාවේ සති තුනක ඊශ්‍රායල සාහසිකත්වය මධ්‍යයේ පලවන මෙම වැකි තුලින් හමන්නේ කුහකත්වයේ දුර්ගන්ධයයි.

අවසානයේදී ඔබාමා එක්සත් ජනපද හමුදාවන්ට ප්‍රනාමය පුදකරයි. ''මෙම පැයේදී බොහෝ දුර බැහැර කාන්තාරවලත් ඈත කඳුකරයන්හිත් මුර සංචාරයේ යෙදෙන අය පෙන්නුම් කරන ඔවුන්ගේ සේවයෙහි ධෛර්යය හරියටම අප සියලු දෙනාට උරුම විය යුතු ධෛර්යය වන්නේය.''

ඇමරිකාව යලි පුබුදුවාලීම පිලිබඳ සිය ''දෘෂ්ඨියෙහි මූල ද්‍රව්‍යයන් ලෙස එනම් මිලිටරියේ ආකල්ප හා ධෛර්යය ජාතියේ චින්තනය ලෙස ඔසවාලීම, මගින් අලුතින් පදවියට පත් ජනාධිපතිවරයා නූතන මිලිටරිවාදය පිලිබඳ පෙලපොතක සංකල්පයක් ගෙනහැර දක්වයි.

ප්‍රථම අප්‍රිකානු-ඇමරිකානු ජනාධිපතිගේ පදවි ප්‍රාප්තියේදී සිවිල් අයිතිවාසිකම් අරගලයේ හෝ ඒ අර්ථයෙන් ගත් කල පන්ති අරගලයේ කුමන රූපාකාරයක් ගැනවත් සඳහන් නොවීම සැලකිල්ලට ගත යුතු කාරනයකි.

එවන් මගහැරීමකට හේතු දෙකක් තිබේ. එකක් අද දින එවන් මහා සමාජ අරගල දිරිගැන්වීමේලා ඔබාමාට කිසිදු අදහසක් නොතිබීම හා අනෙක ඔහු පය ගසා සිටින හා දැන් ඔහු වටා සිටින සමාජ ප්‍රතිගාමීත්වයේ බලවේගයන් විරසක කර නොගැනීමට දක්වන උත්සුකයයි.

කෙසේ වුව ද ඔහුගේ බලාපොරොත්තු කවරක් වුවත් දැන් ඇමරිකාව තුල මෙන්ම ලෝකය පුරා දිගහැරෙමින් ඇති දැවැන්ත ආර්ථික හා සමාජ අර්බුදය එවන් අරගල ඊටත් වඩා මහා පරිමානයෙන් පැන නංවනු ඇත. පුහු හා ව්‍යාජ පදවි ප්‍රාප්ති කථාව තුල යාන්තමින් අඟවා තිබෙන ප්‍රතිපත්තීන් ඇමරිකානු ජනතාවගේ පුලුල් බහුතරයක අපේක්ෂාවන් හා සමාජ අවශ්‍යතාවන් සමඟ මුලුමනින්ම විසංවාදීය. කල් නොයවාම එම විසංවාදයන් දේශපාලන ගැටුමකටත් පන්ති අරගලයේ නව පිපිරීම්වලටත් තුඩු දෙමින් එක්සත් ජනපද ධනවාදයේ පදනම්වලටම අභියෝග කරනු ඇත.

**බිල් වෑන් ඕකන්**

© www.wsws.org